# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය - 2010

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---------------------------------------

1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

(i) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගෙන තිබුණු පිරිවැය රු.14,248,641 ක් වූ විෂයයන් 12 ක වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) නිලධාරියකුගේ සේවා කාලය අවුරුදු 05 ක් වූ විට ඔහු වෙත පාරිතෝෂික ගෙවීම සඳහා මුදල් වෙන්කිරීම ඇරඹීම ආයතනයේ දිගින් දිගටම පවත්වා ගෙන ගිය ගිණුම් ප්‍රතිපත්තිය වුවද, ප්‍රවර්ථන වර්ෂයේ දී සේවය අවුරුදු 01 සිට 04 දක්වා වූ ස්ථිර නිලධාරීන් සඳහා ද පාරිතෝෂික වෙන් කිරීම ආරම්භ කර තිබුණු අතර එම ප්‍රතිපත්තිය වෙනස් කිරීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් වලින් අත්හැරීම්.

(i) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී මිලදී ගෙන තිබුණු රු.150,230 ක් වූ භාණ්ඩ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකර අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 05 කදී ගෙවා තිබුණු රු.142,428 ක් වටිනාකමැති මාර්ගස්ථ මුදල් රක්ෂණ ගාස්තු, වාහන ආදායම් බලපත්‍ර ගාස්තු හා වාහන සඳහා රක්ෂණ ගාස්තු වශයෙන් වූ ඉදිරි වර්ෂය සඳහා කළ ගෙවීම්, ඉදිරියට කළ ගෙවීම් වශයෙන් සලකා ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

(iii) 2009 වර්ෂයට අදාල රු.98,029 ක් වූ ජල බිල්පත් ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් වශයෙන් ගිණුම්ගත වී තිබුණු අතර, වර්ෂයට අදාල රු.83,881 ක් වූ ජල බිල්පත් වටිනාකම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත වී නොතිබුණි.

(ආ) ගිණුම්වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2008 වර්ෂයේ ඉවත් කරන ලද රු.332,174 ක් වූ වත්කම් අයිතම 03 ක් වෙනුවෙන් වාර්ෂික ක්ෂය ප්‍රමාණය වූ රු.63,901 ක් උපලේඛනයෙහි අඩුකර දක්වා තිබුණු බැවින්, වාර්ෂික ක්ෂය ප්‍රමාණය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී දරන ලද වටිනාකම රු.138,751 ක් වූ සවිකිරීම්, අයභාර වියදමක් සේ සලකා ගොඩනැගිලි අළුත්වැඩියා ගිණුමට හර කර තිබුණු අතර, එම හේතුවෙන් ගොඩනැගිලි ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට හර කළ යුතු වටිනාකම රු.3,533,951 ක් වූ වියදම් අයභාර වියදම් ලෙස සලකා ඉඩම් හා ගොඩනැගිලි සුළු අළුත්වැඩියා ගිණුමට හරකර ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

1.2.3 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් ගිණුම් ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන සමඟ සසදා නොතිබුණි.

| ගිණුම් විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපයෝගී ලේඛන / උප ලේඛන අනුව ශේෂය | වෙනස |
| --- | --- | --- | --- |
| | රු. | රු. | රු. |
| ණය හා අත්තිකාරම් | 8,358,403 | 8,782,534 | 424,131 |
| විදුලි වියදම | 1,117,721 | 1,225,709 | 107,988 |

## 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | උපලේඛනයට අනුව ශුද්ධ වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| **ස්ථාවර වත්කම්** | | |
| (i) ගොඩනැගිලි | 164,669,216 | (i) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(ii) යාවත්කාලීනව පවත්වා තිබුණු ස්ථාවර වත්කම් ලේඛනය<br>(iii) විස්තරාත්මක උපලේඛනය |
| (ii) කාර්යාල උපකරණ | 2,079,571 | විස්තරාත්මක උපලේඛන |
| (iii) ඉගැන්වීමේ උපකරණ | 884,474 | |
| (iv) යන්ත්‍ර හා පිරියත | 22,908 | |
| (v) මෙවලම් උපකරණ | 514,168 | |
| (vi) ලී බඩු හා උපකරණ | 7,840,920 | |
| (vii) පරිගණක දෘඩාංග | 4,369,022 | (i) විස්තරාත්මක උපලේඛන<br>(ii) පරිගණක ස්ථාවර වත්කම් ලේඛනය |
| (viii) පරිගණක මෘදුකාංග | 39,470 | |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය.

---------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල.

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් රු.10,901,750 ක ඌනතාවයක් ඇති වී තිබුණු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,170,832 ක් විය.

2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු.61,649,373 ක මුදලින් වියදම් දැරීමෙන් පසුව රු.1,369,405 ක ඌනතාවයක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.60,860,754 පසු ඌණතාවය රු.3,641,328 ක් වී. සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද ස්ථාවර වත්කම් ක්ෂය සඳහා ප්‍රතිපාදනය රු.11,117,769 ක්ද, පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.899,580 ක් ද වශයෙන් එකතුව රු.12,017,349 ක් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය අඩුකිරීමට හේතු වී තිබුණි. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපාදනය රු.6,568,499 ක් ද, පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.1,573,500 ක්ද වශයෙන් එකතුව රු.8,141,999 ක් ලියාහැරීම ඉකුත් වර්ෂයේ ඌනතාවයට හේතු වී තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය.

---------------------------

2.2.1 කාර්ය සාධනය.

-----------------

(අ) සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත සඳහන් පරිදි විය.

(i) 2010 වර්ෂයේ පැවැත්වූ ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය සඳහා 110 ක් වූ ලියාපදිංචි ශිෂ්‍යය සංඛ්‍යාවෙන් විභාගයට පෙනී සිටි ශිෂ්‍යය සංඛ්‍යාව 106 ක් වූ අතර, සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 81 ක් විය.

(ii) ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි I හා II, ශාස්ත්‍රවේදී (විශේෂ) I, II හා III, ජනසන්නිවේදන සහතික පත්‍ර, පරිගණක විද්‍යාව සහතික පත්‍ර හා තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර යන පාඨමාලා සඳහා 2010 වර්ෂයේදී පැවැත්වූ විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 314 ක් වූ අතර, 2011 මාර්තු 16 වූ විගණන දිනය නිමවන විටද, ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි. මේ අනුව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට ලැබුණි.

(ආ) 2010 වර්ෂයේ දේශන පැවැත්වීම්

-----------------------------------

සමාලෝචිත වර්ෂයේදී බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය මගින් සැළසුම්කළ දේශන පැය සංඛ්‍යාව 8040 ක් වූ අතර, පැවැත්වූ දේශන පැය සංඛ්‍යාව 6296 ක් වූයෙන් සැලසුම්ගගත පැය සංඛ්‍යාවෙන් 22% ක් වූ දේශනපැය 1744 ක් පවත්වා නොතිබුණි. මහෝපාධ්‍යායයන් වහන්සේගේ පිලිතුර අනුව ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා තම අභිමතය පරිදි බාහිර ක්‍රියාකාරකම් වලට සහභාගී වීම හා දේශනවලට සහභාගී නොවීම හේතුව වශයෙන් දක්වා තිබුණි.

2.2.2 මානව සම්පත් කළමනාකරණය.

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 03 ක්, කථිකාචාර්ය තනතුරු 05 ක් සහ පුස්තකාලයාධිකාරී තනතුරු 01 ක් වශයෙන් තනතුරු 09 ක් ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලේකම්, ලිපිකරු, රියදුරු සහ කම්කරු තනතුරු 01 බැගින් තනතුරු 04 ක් ද, පුරප්පාඩුව පැවතුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මූල්‍යාධිකාරී තනතුර පැවරුම් පදනම මත බඳවාගෙන තිබුණි.

2.2.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.68,000 ක් වටිනාකමැති ගෙස්ටනර් රෝනියෝ අනුපිටපත් යන්ත්‍ර 01 ක් වසර 05 කට අධික කාලයක සිට පරිහරණයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් පිරිවැය රු.1,101,065 ක් වූ විවිධ වත්කම් තොගයක් අබලි තත්ත්වයට පත්ව ගබඩාවේ ගොඩගසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදීද, එම වත්කම් වෙන්දේසි කර ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

3. පද්ධති හා පාලන.

-------------------

විගණනයේදී නිරීක්ෂණයවූ අඩු පාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි තව දුරටත් විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය.

(ඇ) ණය ගැතියන්

(ඈ) ලේඛන පවත්වාගෙන යාම.

(ඉ) තනතුරු පුරප්පාඩු